# උත්තර භාරතීය සංස්කෘතියේ ළමාවිය හා බැඳුණු හින්දු සංස්කාර් ධර්ම මෙරට සංස්කෘතියට කළ බලපෑම හා එහි නූතන භාවිතය

*පඤ්ඤාමූර්ති, පූජ්‍ය දඹෝරේ* [1]

උත්තර භාරතීය සංස්කෘතියට අදාළව ළමාවිය හා බැඳුණු චාරිත්‍ර මගින් මෙරට සංස්කෘතියට එල්ල වූ බලපෑම සහ ඒවායේ වත්මන් භාවිතය පිළිබඳ අධ්‍යයනයක යෙදීම මෙහි අරමුණයි. මෙහිදී චාරිත්‍ර පිළිබඳව රචිත සංස්කෘතික හා ඉතිහාස පොතපත, අන්තර්ජාල සටහන්, රූප රාමු හා ඇතැම් පර්යේෂණ දත්ත උපයෝගී කොට ගෙන ඇත. භාරතීය ජන ජීවිතය, ආගම හා තදින් බැඳී ඇති අතර, එය ආගම ඇසුරින්ම උපන් සංස්කෘතියකින්ද උපලක්ෂිත වූවකි. හින්දු භක්තිකයන්ගේ ජීවිතය තරම් ආගමික වත් පිළිවෙත්වලින් පිරි තවත් ජීවිතයක් නැති තරම්ය. මව් කුසින් බිහිවීමටත් පෙර සිට ඔවුන්ගේ වත් පිළිවෙත් ඇරඹේ. සම්මතය අනුව උපතේ සිට නොව යමකු මව්කුස පිළිසිඳ ගැනීමේ සිට මරණය තෙක් සමස්ත ජීවිතය මුළුල්ලේ ඉටු කළ යුතු සංස්කාර හෙවත් ආගමික චාරිත්‍ර හතළිහක් පමණ වේ. මෙයින් ප්‍රධානම කරුණු දහසයක් ඉන්දියානු ජන ජීවිතයේදී කැපී පෙනෙන අතර, ඒවා '**සෝලහ් සංස්කාර්**' නම් වේ. '**සංස්කාර්**' යනු හින්දු භක්තිකයාගේ ජීවිතය වටා ගෙතුණු පුද්ගලබද්ධ ආගමික චාරිත්‍රයි. මේවා අදියර 5ක් යටතේ පුද්ගලයාට බලපායි. ඉන් වැඩි අවස්ථාවක් හා වටිනාකමක් හිමිව ඇත්තේ ළමාවියට අදාළ චාරිත්‍ර සඳහායි. **චතුර් ආශ්‍රම ධර්ම** අනුව හින්දු බැතිමතාගේ ජීවිතය යුගවලට බෙදී යයි. ඔහු පළමුවර මව් කුසින් මෙන්ම උපනයනයේදී පූන නූල පැලඳීමෙන් දෙවන වරද ආර්යයෙකු ලෙස උපදින්නේ ළදරුවා ආර්ය සමාජයේ පරිපූර්ණ සාමාජිකයෙකු නොවන බැවිනි. මෙම චාරිත්‍ර එවකට උසස් කුල සම්භාවනාවට පාත්‍ර වුවද සර්වජන සාධාරණ වූ බවක් නම් දක්නට නොලැබේ. ආගමික හා සංස්කෘතික සම්ප්‍රේෂණයෙන් මෙරට සංස්කෘතියටද එකතු වූ මෙම චාරිත්‍ර මෙරට ජනවිඥානය පුරාද පැතිරී ඇත. කන් විදීම, ඉඳුල් කටගෑම, කෙස් කැපීම ලෙස හැඳින්වෙන්නේ හින්දු සංස්කාරවල මෙරට අනුකරණයයි.

**ප්‍රමුඛ පද:** හින්දු සංස්කාර්, ළමාවිය, චතුර් ආශ්‍රම ධර්ම, හින්දු සමය, චාරිත්‍ර

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*sandakadapahana2@gmail.com*